# විෂය නිර්දේශය

(පළමුවන ප්‍රධාන අවධිය සඳහා)

# මව්බස

## දෙවන ශ්‍රේණිය

ප්‍රාථමික අධ්‍යාපන ඒකකය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකා

2007

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

# විෂය නිර්දේශය
## මව්බස (සිංහල) - දෙවන ශ්‍රේණිය

## 1.0 හැඳින්වීම

මව්බස විෂය සවන් දීම, කතා කිරීම, කියවීම, ලිවීම වශයෙන් ක්ෂේත්‍ර හතරක් යටතේ ඉදිරිපත් කර ඇත. ගුරුවරයාට විෂය අන්තර්ගත කරුණු පැහැදිලි කර ගැනීමට පහසු වනු පිණිස එසේ ඉදිරිපත් කර ඇතත් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීමේ දී මෙම ක්ෂේත්‍ර අදාළ පරිදි සමෝධානය කර ගැනීම අපේක්ෂා කෙරේ.

2007 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන නිපුණතා පාදක ප්‍රවේශයේ දී, මූලික නිපුණතාවක් ලෙස සාක්ෂරතාව සඳහන් කෙරේ. එහි දී, සාවධානව ඇහුම්කන් දීම, පැහැදිලි ව කතා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව හා නිරවුල් ව ලිවීම, ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම යන නිපුණතා කරා සිසුන් ළඟා කරවීම අපේක්ෂිත ය.

මෙම සන්නිවේදන නිපුණතාවලට අමතර ව පරිසරයට අදාළ නිපුණතා, වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතාව, ආචාර ධර්මවලට හා ආගමට අදාළ නිපුණතා, ක්‍රීඩා හා විවේකය ප්‍රයෝජනයට ගැනීම පිළිබඳ නිපුණතා, පෝෂණය වර්ධනයට අදාළ නිපුණතා ඉගෙනීමට ඉගෙනීම පිළිබඳ නිපුණතා යන අනෙක් නිපුණතා වර්ධනය වන ලෙසින් විෂයයට අදාළ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීම අපේක්ෂා කෙරේ.

## 02. නිපුණතා

(අ) **ප්‍රාථමික අධ්‍යාපන අවධිය සඳහා නිපුණතා**

* එදිනෙදා අවශ්‍යතා සඳහා සවන් දීමේ, කතා කිරීමේ කියවීමේ හා ලිවීමේ හැකියා ප්‍රදර්ශනය කරයි.
* කවි, ගී, කතන්දර අසා සහ කියවා රස විඳියි.
* නිවැරදි උච්චාරණය සහිත ව ශබ්ද නගා කියවයි.
* ක්‍රමවත් ව පැහැදිලි ව හා නිවැරදි ව ලියයි.
* සවන්දීම, කතා කිරීම, කියවීම හා ලිවීම සම්බන්ධ හොඳ පුරුදු ප්‍රදර්ශනය කරයි.
* පොත් පත් කියවා තේරුම් ගනියි. රස විඳියි.
* තම අත්දැකීම් වාර්තා කිරීමට හා අදහස් නිර්මාණාත්මක ව ප්‍රකාශ කිරීමේ හැකියා ප්‍රදර්ශනය කරයි.
* සමූහයක් ඉදිරිපිට තම අදහස් සුහද ව, නිරවුල් ව හා ආචාරශීලී ව ඉදිරිපත් කරයි.

(ආ) **දෙවන ශ්‍රේණිය අපේක්ෂිත නිපුණතා**

* සවන් දී වින්දනය ලබයි
* අවධානයෙන් සවන් දී නිරවුල් ව අවබෝධ කර ගනියි
* ළමා කවි ගී ගායනය කිරීමේ අත්දැකීම් ලබයි
* සන්නිවේදන අවශ්‍යතා සඳහා සවන් දී කථනයේ යෙදෙයි
* නිරවුල් ව අදහස් හා අත්දැකීම් පවසයි
* සවන් දී චින්තනයට යොමු වෙයි
* ශුද්ධ සිංහල හෝඩියේ අක්ෂර සහිත වචන හඳුනාගෙන කියවයි
* පිළි යෙදුණු වචන නිවැරදි ව උච්චාරණය කරමින් කියවයි
* නැවතීමේ ලකුණ හා ප්‍රශ්නාර්ථය ගැන සැලකිලිමත් ව ශබ්ද නගා කියවයි
* නියමිත අංග හා හැඩය සහිත ව ප්‍රමාණය ගැන සැලකිලිමත් ව රූල් අතර ලියයි
* සන්නිවේදන අවශ්‍යතා සඳහා ලිවීමට යොමු වෙයි

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

* නිර්මාණාත්මක ව ලිවීම සඳහා යොමු වෙයි

## 3. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

දෙවන ශ්‍රේණිය සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කිරීමේ දී සෙල්ලම් හා විනෝදජනක වැඩ වැඩි වශයෙනුත්, ක්‍රියාකාරකම් අවශ්‍ය පරිදිත්, අසුන් ගත වැඩ අඩුවෙනුත්, යොදා ගැනීම අපේක්ෂා කෙරේ. මෙහි දී කුඩා කණ්ඩායම් වැඩ, විශාල කණ්ඩායම් වැඩ, පන්තියම කණ්ඩායමක් ලෙස ගෙන කරන වැඩ සහ තනි වැඩ අදාළ පරිදි සැලසුම් කර ගැනීම අවශ්‍ය ය.

මව්බස විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ දී ඒ හා බැඳුණු පෙළ පොත සහ වැඩ පොත යොදා ගත යුතු ය. ඒ සඳහා ද මග පෙන්වීම් ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙහි අන්තර්ගත වේ. පෙළ පොත භාවිතයේ දී නිර්මාණශීලී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම යොදා ගනිමින් සිසුන් තුළ නිර්මාණශීලී භාවය ඇති කිරීම ද අපෙක්ෂා කෙරේ.

## 4. පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන්

මව්බස විෂය හා බැඳුණු වැඩසටහන් රාශියක් පාසල තුළ ක්‍රියාත්මක වේ.

* උදෑසන රැස්වීම්
* පන්ති රැස්වීම්
* විවිධ ප්‍රසංග
* ප්‍රදර්ශන
* සිහිති පොළ
* ආගමික වැඩසටහන්
* ගුරු දෙගුරු දින ඉන් සමහරකි

ඉහත දැක්වෙන පාසල් වැඩසටහන්වල දී සිසුන්ගේ භාෂා කුසලතා වර්ධනය සඳහා පහත දැක්වෙන ක්‍රියාකාරකම් නිර්මාණශීලී ව යොදා ගත හැකි වේ.

එනම් ,

* කථන ක්‍රියාකාරකම්
* සාමූහික හා තනි තනිව කෙරෙන ගායනා
* රංගන හා රූපණ ආශ්‍රිත ක්‍රියාකාරකම් ඊට උදාහරණ ලෙස දැක්විය හැකි ය

## 5. තක්සේරු කිරීම

මෙම ශ්‍රේණියේ දී මව්බස විෂය තුළ ලිඛිත පරීක්ෂණ වැනි ඇගයීම්වලට වඩා ප්‍රමුඛත්වය දිය යුතු වන්නේ සිසුන් සමඟ වැඩ කරමින් හා සිසුන්ගේ වැඩ නිරීක්ෂණය මඟින් සිදු කරන ඇගයීම් විධිවලට ය. සෙල්ලම් හා විනෝදජනක වැඩ ක්‍රියාකාරකම්, පෙළ පොත හා වැඩ පොත භාවිතය වැනි අවස්ථාවල දී නිරීක්ෂණය, සාකච්ඡා, වාචික ප්‍රශ්න වැනි තක්සේරු ක්‍රම මඟින් දෙවන ශ්‍රේණියට අදාළ නිපුණතා වර්ධනය වීම සිදු වන්නේ දැයි නිරතුරු ව තොරතුරු රැස් කරමින් ඇගයීමට ලක් කිරීම අපේක්ෂා කෙරේ.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 1.0 සවන් දීම

1.1 සවන් දෙමින් වින්දනය ලබයි
- සරල කවිවලට සවන් දෙමින් වින්දනය ලබයි
- කතන්දරවලට සවන් දෙමින් වින්දනය ලබයි

1.2 සන්නිවේදන අවශ්‍යතා සඳහා සවන් දෙයි
- සුහද කතා බහට සවන් දෙයි
- එදිනෙදා අවශ්‍යතා සඳහා සවන් දෙයි
- විශේෂ අවස්ථාවල දී අවධානයෙන් සවන් දෙයි

1.3 සවන් දී චින්තනයට යොමු වෙයි
- තේරවිලිවලට සවන් දී චින්තනයට යොමු වෙයි
- කතන්දර අසා චින්තනයට යොමු වෙයි
- සිදුවීම් ගැන අසා චින්තනයට යොමු වෙයි

1.4 අවධානයෙන් සවන් දී අවබෝධ කර ගනියි
- විධානවලට සවන් දී අවබෝධ කර ගනියි
- නිවේදනවලට සවන් දී අවබෝධ කර ගනියි
- සරල කතන්දරවලට සවන් දී අවබෝධ කර ගනියි
- සරල උපදෙස්වලට සවන් දී අවබෝධ කර ගනියි

## 2.0 කතා කිරීම

2.1 ගායන හැකියා ලබා ගනියි
- විවිධ ශෛලීන් අනුව ගායනා කළ හැකි ක්‍රීඩා කවි /ගී ගායනා කරයි
- රංගනය හා ගායනය මුසු කළ හැකි ළමා කවි /ගී ගායනා කරයි

2.2 සන්නිවේදන අවශ්‍යතා සඳහා කථනයේ යෙදෙයි
- සුහද කතා බහේ යෙදෙයි
- අත්දැකීම් පවසයි
- පණිවුඩ ගෙන යයි
- සිදුවීම් හා ආරංචි පවසයි

2.3 අවශ්‍යතා සඳහා කථනයේ යෙදෙයි
- උපදෙස් ලබා දෙයි
- ප්‍රශ්න කරයි
- තොරතුරු රැස් කරයි

2.4 නිර්මාණාත්මක කථන හැකියා ප්‍රදර්ශනය කරයි
- සාමූහික ව කතන්දර නිර්මාණය කරයි
- රූප රාමු ඇසුරෙන් සිදුවීම්/කතන්දර නිර්මාණය කරයි
- සිද්ධි සමූහයක් ඇසුරෙන් කතන්දර නිර්මාණය කරයි

## 3.0 කියවීම

3.1 වචන/වැකි/කෙටි ඡේද ශබ්ද නගා කියවයි
- ශුද්ධ සිංහල හෝඩියේ අක්ෂර හඳුනාගෙන කියවයි
- ඇලපිල්ල, අල්කිරීම්, ඉස්පිල්ල, පාපිලි, ඇදය යන පිලි හ්‍රස්ව හා දීර්ඝ වශයෙන් හඳුනාගෙන නිවැරදි ව උච්චාරණය කරමින් කියවයි
- නැවතීම, ප්‍රශ්නාර්ථ ලකුණ ගැන සැලකිලිමත් ව කියවයි
- කොම්බුව හඳුනාගෙන එය යෙදුණු තැන් නිවැරදි ව උච්චාරණය කරමින් කියවයි

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

3.2 කියවීමේ වේගවත් බව හා ප්‍රවීණවත් බව වර්ධනය කර ගනියි
- වමේ සිට දකුණට කියවයි
- උඩ සිට පහළට නම් ලැයිස්තු කියවයි
- වේගවත් ව කියවා ප්‍රතිචාර දක්වයි
- උපදෙස් කියවා අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි

3.3 නිශ්ශබ්ද ව කියවා අවබෝධ කර ගනියි
- සරල වචන නිශ්ශබ්ද ව කියවා අවබෝධ කර ගනියි
- සරල වාක්‍ය නිශ්ශබ්ද ව කියවා අවබෝධ කර ගනියි
- සරල කවි නිශ්ශබ්ද ව කියවා අවබෝධ කර ගනියි
- රූපික ප්‍රකාශන හොඳින් නිරීක්ෂණය කර අවබෝධ කර ගනියි

3.4 වාග්මාලාව පෝෂණය කර ගනියි
- සමීප පරිසරයේ දක්නට ලැබෙන දේවල නම් කියවයි
- නෑදෑකම් හඳුන්වන වචන කියවයි
- විවිධ ක්ෂේත්‍ර හා සම්බන්ධ ව එදිනෙදා භාවිත වන වචන කියවයි

## 4.0 ලිවීම

4.1 අකුරු නිවැරදි ව ලිවීමේ හැකියාව ලබයි
- අකුරක නියමිත අංග සහිත ව ලියයි
- අකුරක නියමිත හැඩය හා ප්‍රමාණය ගැන සැලකිලිමත් ව ලියයි
- රූල් අතර ලියයි
- වචනයක අකුරු ළං ව ලියයි
- වැකියක වචන අතර පරතරයක් සහිත ව ලියයි

4.2 අර්ථය නිවැරදි ව දැක්වෙන පරිදි ලියයි
- නිවැරදි අකුරු යොදා අර්ථවත් වචන ලියයි

4.3 සන්නිවේදනය සඳහා ලියයි
- පණිවිඩ ලියයි
- තමන්ගේ හා යහළුවන්ගේ නිවසට යන ගමන් මග ඇඳ නම් කරයි
- එදිනෙදා සිදුවීම් ලියයි
- තමා පිළිබඳ ව ලියයි

4.4 නිර්මාණාත්මක ව ලිවීමට පෙළඹෙයි
- පින්තූරයක් බලා තම අදහස් ලියයි
- දෙන ලද වැකියක් අනුව දෙවන වැකිය ගොඩ නගා ලියයි
- යම් වචනයක් හෝ ද්‍රව්‍යයක් පිළිබඳ ව වැකි ලියයි

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.